# UNIVERSITY STUDENTS UNION AND FACULTY STUDENTS UNION

(Section 112)

*[Added the Schedule, 26 of 1988]*

1. (1) The University Students Union of each Higher Educational Institution shall be representative of the entire student community of the Institution.

(2) The University Students Union of each Higher Educational Institution shall consist of all the members of each Faculty Students Union and such Union shall elect the following office-bearers:

(a) President;

(b) Vice-president;

(c) Secretary;

(d) Editor; and

(e) Junior Treasurer.

2. The duties and functions of the University Students Union shall be -

(a) to foster the spirit of corporate life among students of the University;

(b) to organize and supervise, in consultation with the governing authority student welfare activity in the University, recreational facilities, spiritual and religious activities, the counselling of students and the supply of meals and refreshment;

(c) to afford a recognized means of communication with the authorities of such higher educational institution on matters relating to or connected with living and working conditions of the students;

(d) to be represented on any other body which may, in accordance with the rules made by the governing authority for the purpose, be appointed to undertake student welfare activities in the university;

(e) to assist the university authorities to maintain discipline;

(f) to represent students who are accused in disciplinary inquiries;

(g) to foster, cultural, literary and aesthetic awareness and activities among students and to organize and publish magazines and periodicals of the students;

(h) to foster an interest and understanding in the arts and life and social well-being of the citizens of the country;

(i) to foster activity conducive to the social and moral well-being of the student community and promote activity conductive to healthy social life;

(j) to organize and promote cultural, literary and social interactivity with other universities and like organizations in Sri Lanka and abroad;

(k) to associate in the organization and execution of extension courses and adult education programmes in collaboration with the staff and students;

(l) to safeguard and protect the good name of the Higher Educational Institution;

(m) to debate matters of public interest;

(n) to further national interest and national unity;

(o) to safeguard and protect the property of such Higher Educational Institution;

(p) to take steps to encourage and further the academic interest; and

(q) to undertake any activities that may be determined by the governing authority from time to time.

3. (a) There shall be a Senior Treasurer for the University Students Union who shall be a senior teacher nominated by the office-bearers of such Union.

(b) An office-bearer of the University Students Union may hold office concurrently in a Faculty Students Union.

(c) The office-bearers referred to in this Act shall cease to hold office at the end of an academic year.

(d) Where an office in the University Students Union falls vacant, then such Union shall as soon as possible elect a suitable person to fill that vacancy. The person so elected shall hold office for the unexpired portion of the term of office of his predecessor.

(e) Where an office in a Faculty Students Union falls vacant the students of that Faculty shall as soon as possible elect a suitable person to fill that vacancy. The person so elected shall hold office for the unexpired portion of the term of office of his predecessor.

4. (1) A University Students Union may raise funds with the approval of the principal executive officer of the Higher Educational Institution concerned for social, cultural and welfare activities approved by such principal executive officer

(2) The governing authority of a Higher Educational Institution shall make rules relating to the disbursement of funds by the University Students Union or a Faculty Students Union, and the manner of keeping the accounts, of the respective Unions.

5. The governing authority of Higher Educational Institution shall make Rules relating to the conduct of meetings and the manner of maintaining records of the proceedings of such meetings of the University

Students Union and the Faculty Students Union.

6. (1) A Faculty Students Union shall be representative of all students of such Faculty and the office-bearers of such Union shall be elected by the students of such Faculty by secret ballot for that academic year.

(2) A Faculty Students Union shall consist of -

(a) President;

(b) Vice-President;

(c) Secretary;

(d) Editor;

(e) Junior Treasurer; and

(f) such other members as may be determined by each Higher Educational Institution in the following manner:-

(i) two members for a Faculty with two hundred or less registered students;

(ii) four members for a Faculty with two hundred and one to four hundred registered students;

(iii) six members for a Faculty with four hundred and one to six hundred registered students; and

(iv) eight members for Faculty with over six hundred registered students.

(3) There shall be a Senior Treasurer for each Faculty Students Union who shall be a senior teacher, nominated by the office-bearers of such Union.

7. The duties and functions of a Faculty Students Union shall be -

(a) to promote the corporate life and welfare of the student community of the Faculty;

(b) to take steps to encourage and further the academic interests of its students;

(c) to safeguard and protect the good name of the Faculty and Institution;

(d) to foster cultural and sports activities amongst the students of the Faculty;

(e) to make recommendations to the University Students Union on matters pertaining to the disbursement of the funds and the general welfare of the student community of the Faculty; and

(f) to ensure that all decisions of a Faculty Students Union pertaining to the academic and welfare activities of the Faculty are taken by a majority vote of its members.

# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## 1996 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථා මාලාව

### 1 කොටස

1985 අංක 07 සහ 1988 අංක 26 දරණ පනත් වලින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 112 (3) වගන්තිය සමග කියවිය යුතු 135 වගන්තිය යටතේ රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථාව.

1. මේ අතුරු ව්‍යවස්ථාව **1996 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව** යනුවෙන් හඳුන්වනු ලබන අතර, නිලවරණය පවත්වනු ලබන්නේ කිසියම් අධ්‍යයන වර්ෂයක සඳහා ද, ඒ අධ්‍යයන වර්ෂයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් (සංශෝධිත) හෝ වෙනයම් සාධක පත්‍රයක් මගින් ප්‍රධාන විධායක නිලධාරි වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල කාර්ය සහ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්තාවලියේ කිසිවකින් කිසිදු ආකාරයකින් හීන කරවන ලෙසට වටහා නොගත යුතුය.

3. (i) මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වීම මත මෙම අතුරු ව්‍යවස්තාවේ 3 (11) සහ 3 (111) අනුඡේද වල සලකනු ලැබ ඇති විධිවිධාන ප්‍රකාරව රජරට විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති සංස්ථාපනය කරනු ලැබිය යුතුය.

   (ii) 1988 අංක 26 දරණ විශ්වවිදයාල (සංශෝධන) පනතේ උප ලේඛණයෙන් නිශ්චිතව දන්වා ඇති 1, 1 (2), 2 සහ 3 වගන්ති වලින් විධිවිධාන සලසා ඇති පරිදි රජරට විශ්විවද්‍යාල ශිෂ්‍ය සමිතියට, සිය සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය සඳහා අධිහාර බලය ලැබෙන්නේය.

   (iii) රජරට විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන පීඨයන් සඳහා පීඨ ශිෂ්‍ය සමිතියක් තිබිය යුතුය. 1988 අංක 26 දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දන්වා ඇති 6(1), 6(2), 6(3) සහ 07 වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි එම පීඨ ශිෂ්‍ය සමිති තමන්ගේ සංයුතිය, කාර්ය සහ කර්තව්‍යයන්ගේ අධිහාර බලය ලබා ගනි

## II කොටස

4. පතන මගින් හෝ වෙනත් යම් සාධක පත්‍රයක් මගින් හෝ රජරට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය මත පවරන ලද හෝ නියම කරන ලද හෝ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ගේ පොදු අදාලත්වයට අගති විරහිතව, මෙම අතුරු ව්‍යවස්ථාවේ පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකිව යුතු වන්නේය.

5. පීඨයක ශිෂ්‍යයෙක්,

(අ) පූර්ණකාලීණ උපාධි අපේක්ෂක ශිෂ්‍යකු වශයෙන් නිසියාකාරව ලියාපදිංචි කොට ඇතුලත් කරගනු ලැබ නොමැත්තේ නම් හෝ නිලවරණය පැවැත්වෙන අධ්‍යයන වර්ෂය තුල අදාල පීඨයෙහි අධ්‍යයන පාඨමාලාවක් නොහදාරයි නම් හෝ,

(ආ) පීඨයෙන් සහ / හෝ විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යභාවය අත්හිටවනු ලැබ ඇත්තේ නම් හෝ,

(ඇ) ඡන්දය දෙන අවස්ථාවේදී සිය අනන්‍යතාවය තහවුරු කිරීමට අසමත් වන්නේ නම් හෝ,
ඡන්දයකදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යාර්ථයන් සඳහා,

(i) ලියාපදිංචි ශිෂ්‍යයෙකු යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා විශ්වවිද්‍යාලීය ලියාපදිංචිය ලබාගෙන විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇතුලත් කරගනු ලැබ ඇති කිසියම් උපාධි අපේක්ෂකයෙකු හෝ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා හෝ වෙනත් අධ්‍යයන කාල පරිච්ඡේදයක් සඳහා හො 'කලින් කල අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම පිණිස නිසි පරිදි ඇතුලත් කරගෙන ලියාපදිංචි කරනු ලැබූ ශිෂ්‍යයෙකි.

7. (i) එක් එක් අධ්‍යයන වර්ෂයක ප්‍රථම වාරය ඇරඹි මාසයක් ඇතුලත් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින්, විශ්වවිද්‍යාල සීමාවන් ඇතුලත්

(අ) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියේ නම

(ආ) එම එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා තෝරාගතයුතුව ඇති නිලධාරයන්ගේ තනතුරු නම් සහ අනෙක්සාමාජිකයින්ගේ සංඛ්‍යාව

(ඇ) එබඳු එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධරයන් සහ වෙනත් සාමාජිකයින් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට

සුදුසුකම් ලබන සිසුන්ගේ නම් හා ලියාපදිංචි අංකයද ඇතුළත් කරමින් විශ්වවිද්‍යාල සීමාවන් ඇතුළත් දැන්වීමක් ප්‍රසිද්ධ කළ යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රථම සිමිතිය සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් නියම කරනු ලැබිය හැකි දිනයකදි ඉහත කී දැන්වීම ප්‍රසිද්ධ කරනු ලැබිය හැකිය.

8. එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියකට නිලධාරීන් හා වෙනත් සාමාජිකයින් තෝරා ගැනීමේ නිලවරණය වෙනුවෙන් එම නිලවරණය පැවැත්වීම සඳහා පුද්ගලයෙකු (මෙහි මින් මතු නිලවරණ නිලධාරියා වශයෙන් හඳුන්වනු ලබන) නම හා තනතුරු නාමය සහිතව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් නම් කළ යුතුය. මෙම කර්තව්‍යයෙහිලා කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ සහාය කර ගැනීමට නිලවරණ නිලධාරියට හැකි වන්නේය.

9. (i) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන්, එම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් හා අනෙක් සාමාජිකයින් තෝරා ගැනීමේ නිලවරණය සඳහා නිලවරණ නිලධාරි විසින් නාම යෝජනා කර ගැනීම අවසන් කරනු ලබන වේලාව, ස්ථානයන් සහ දිනයන් විශ්වවිදයාලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් නියම කරනු ලැබිය යුතුය. එම දිනය මෙම අතුරු ව්‍යවස්ථාවේ 7 (1) වගන්තිය යටතේ දැන්වීම ප්‍රසිද්ධ කරනු ලබන දින සිට දින 08 ක් ඉකුත්වීමෙන් පසුව නමුත් දින 14 ක් ඉකුත්විමට පෙරාතුව යෙදෙන දිනයක් විය යුතුය.

(ii) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නාම යෝජනා භාරගැනීම සම්බන්ධයෙන් නියම කරනු ලබන දිනය, වේලාව හා පිළියෙළ කරන ලද ස්ථානය අප්‍රමාදවම, විශ්වවිධයාලයේ ලේඛකාධිකාරි විසින් විශ්වවිදයාල සීමාව ඇතුළත ප්‍රසිද්ධ කළ යුතුය.

(iii) නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ මෙම අතුරු ව්‍යවස්ථාවේ උප ලේඛණය 1 හා දක්වනු ලබන ආකෘතිගත වේ. නාම යෝජනා පත්‍රයෙහි යෝජකගේ සහ ස්ථිර කරුගේ නම්ද ඔවුන්ගේ ශිෂ්‍ය ලියාපදිංචි අංකයද ඇතුළත් වියයුතු අතර, නාම යෝජිතයා විසින් නිලවරණයන්ට ඉදිරිපත්වීමට තම එකගත්වය ප්‍රකාශ කිරීමේ සංකේතයක් වශයෙන් සිය අත්සන එහි යෙදියයුතුවේ. ලියාපදිංචි සෑම අපාධි අපේක්ෂක ශිෂ්‍යයෙක්ම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකු හෝ සාමාජිකයෙකු වශයෙන් තෝරා ගැනීමේ අපේක්ෂකත්වයට නම් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේය. යෝජකයන් සහ ස්ථිරකරුවන් තමන් විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් අයත් පීඨයෙන්ම උපාධි අපේක්ෂකයන් විය යුතුය.

(iv) මොනයම් හෝ නිලවරණයකදි යම් සිසුවෙකු එකකට වැඩි තනතුරු සංඛ්‍යාවකට හෝ එක යෝජකයෙකුට හෝ එක ස්ථිරකරුවෙකුට හෝ වැඩි සංඛ්‍යාවක් විසින් නාම යෝජනා කරනු ලැබීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

(v) මෙසේ ලැබෙන නාම යෝජනා පත්‍ර. නාම යෝජනා භාරගන්නට යෙදුන දිනට පසුව දින. නිලවරණ නිලධාරි විසින් පීඨ දැනුවීම් පුවරු මත ප්‍රදර්ශනය කරනු ඇත.

(vi) නාම යෝජනා කරනු ලැබ ඇති පුද්ගලයන් කෙරෙහි විරෝධතා ඇතොත් එම විරුද්ධතාවයට පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින්. නාම යෝජනා ප්‍රදර්ශනය කිරිමට පසුව එක දිනයක් ගතවන්නට පෙරාතුව එම පීඨයේ යම් අපාධි අපේක්ෂක සිසුවෙකු විසින් නිලවරණ නිලධාරි වෙත ඉදිරිපත්කළයුතුවේ. නාම යෝජනාවන් වලංගුද නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ ප්‍රධාන විධායක නිලධරයා විසින් වන අතර. එම තීරණය අවසන් තීරණය ද වේ.

10. (i) යම් පීඨ ශිෂ්‍ය සමිතියක එක් එක් තනතුර සම්බන්ධයෙන් එක් නාම යෝජනා පත්‍රය බැගින් පමණක් ලැබ ඒවා පිළිගනු ලැබ ඇති අවස්ථාව ඒ ඒ නිලය සඳහා එම නාම යෝජනා පත්‍රයෙහි නිශ්චිත අපේක්ෂකයන් තෝරා ගන්නා ලද බව නිලවරණ නිලධාරි විසින් ප්‍රකාශයට පත් කල යුතුය.

(ii) නාම යෝජනා පත්‍ර ලැබී නොමැති විටකදී. එම පීඨ ශිෂ්‍ය සමිතිය පිළිබඳව. ප්‍රධාන විධායක නිලධාරිගේ උපදෙස් මත නිලවරණ නිලධාරි විසින් නාම යෝජනා භාරගැනිම සඳහා අලුතින් දිනයක්. වේලාවක් සහ ස්ථානයක් නියම කරනු ලැබිය යුතුය.

11. (i) වශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධාරින් හා වෙනත් සාමාජිකයින් තෝරා ගැනීම සඳහා දිනයක් නියම කළ යුතුවේ. එම දිනය. එකී පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාම යෝජනා පත්‍ර ලබාගන්නා දින සිට දින 14 ක් ඇතුලත් ගැනෙන දිනයක් විය යුතු අතර. එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නිලවරණ පැවැත්විම සම්බන්ධයෙන් නියම කරගනු ලබන දිනයද එයම විය යුතුය.

(ii) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නිලධරයන් හා වෙනත් සාමාජිකයන් තේරිම සඳහා නියම කරගනු ලබන දිනය. වේලාව සහ ස්ථානයද විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින්. විශ්වවිද්‍යාල සීමාව ඇතුලත් ප්‍රසිද්ධ කලයුතු වේ.

(iii) නිලවරණ නිලධාරි විසින් රහස් ජන්ද නිලවරණ පැවැත්විය යුතුය.

12. පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයකදී තරග කරන එක් එක් අපේක්ෂකයාට. ජන්දය පාවිච්චි කිරිමේ සහ ගණන් කිරිමේ කාලය තුලදී. ජන්දය පවත්වන ස්ථානයේදි තමා නියෝජනය කිරිම සඳහා ජන්ද ඒජන්තවරුන් වශයෙන් සිසුන් දෙදෙනෙකු පත්කර ගැනීමට පුලුවන. එබඳු සෑම දැන්වීමක් සම්බන්ධයෙන්ම පත්කරනු ලබන ශිෂ්‍යන්ගේ නම් සහ ලියාපදිංචි අංක සඳහන් කරමින් අපේක්ෂකයා විසින් ඡන්දය ආරම්භ කිරිමට මත්තෙන් නිලවරණ නිලධාරි වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එකකුදුවත්, ඡන්දය පාවිච්චි කිරීමේ හෝ ගණන් කිරීමේ හෝ මොනයම් අවස්ථාවකදී වුවද ඡන්ද පොල වෙත පෙනී සිටිය හැක්කේ ඉන් එක්ජන්ද නියෝජිතයෙකුට පමණි.

13. (i) 1988 අංක 26 දරණ සංශෝධන විශ්වවිද්‍යාල පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි සෑම ලියාපදිංචි ශිෂ්‍යයෙකුටම, පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයකදී එක් තනතුරක් සඳහා එක් අපේක්ෂකයෙකුටද, එම පීඨ ශිෂ්‍ය සමිතියට තෝරා ගනු ලැබීමට නියමිත අනෙකුත් සාමාජික සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවකටද ඡන්දය දීමට හිමිකම් තිබිය යුතුය.

(ii) එක් එක් නිලය සඳහා ඉහළම ඡන්ද සංඛ්‍යාවක් ලද අපේක්ෂකයා තෝරා පත්කර ගනු ලැබූ බව නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත්කල යුතුවේ.

(iii) 1988 අංක 26 දරණ සංශෝධන පනතේ උප ලේඛනයෙහි නිශ්චිතවම දත්ව ඇති පරිදි එක් ඒක පීඨය සදාහ නිලවරණයකදී තෝරා ගනු ලබන සාමාජිකයින් සංඛ්‍යාව යම් තරම් වේද, එම සංඛ්‍යාවට සමාන වන තෙක් අවරෝහණ ක්‍රමයට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා අපේක්ෂකයින් සාමාජිකයින් වශයෙන් තෝරා පත්වී ඇති බව නිලවරණ නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතුය.

(iv) නිලධාරියෙකු හෝ වෙනත් සාමාජිකයෙකු හෝ තෝරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයකදී අපේක්ෂකයන් දෙදනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව අතර සමානත්වයක් ඇති බව පෙනී යන අවස්ථාවකදී තෝරා ගත යුතු නිලධරයා / සාමාජිකයා කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතුය.

14 (i) පීඨ ශිෂ්‍ය සමිතියක එක් එක් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු, තමන් තෝරාගනු ලබන දින සිට එසේ තෝරාගනු ලැබූ අදාල අධ්‍යයන වර්ෂයේ අවසාන දක්වා එම නිලද දැරිය යුතුවේ.

(ii) එක් අධ්‍යයන වර්ෂයකට වඩා කාලයක් සඳහා එම නිලය දැරීමට හෝ එම නිලයටම නැවත තෝරා පත්කර ගනු ලැබීමට හෝ කිසිදු සිසුවෙක් හිමිකම් නොලැබිය යුතුය.

(iii) කිසියම් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු,

:(අ) තවදුරටත් ශිෂ්‍යයෙකු නොවන්නේ නම් හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත සිය අත්සන යටතේ ලිඛිතව දක්ව තනතුරෙන් ඉල්ලා අස්වේ නම් හෝ

(ඇ) විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යභාවය තහනම් කරනු ලැබූ හෝ නෙරපනු ලැබ ඇතිනම් හෝ

ඔහුගේ නිලය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතුය.

(iv) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකුගේ / සාමාජිකයෙකුගේ හෝ තනතුර පුරප්පාඩු වන අවස්ථාවකදී එම පීඨයේ සිසුන් විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ කලින් විධිවිධාන වලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරි විසින් තීරණය කරනු ලබන පරිදි එම පුරප්පාඩුව පිරවීම සඳහා පුද්ගලයෙකු තේරීම පිණිස නිලවරණයක් පැවැත්වීමට කටයුතු ආරම්භ කලයුතුය. එසේ තෝරාගනු ලැබූ පුද්ගලයා ස්වකීය පූර්ව ප්‍රාප්තිකයාගේ නිල කාලයෙන් නොගෙවුනු කාල පරිච්ඡේදය සඳහා එම තනතුර දරන්නේය.

15 (i) ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය.

(අ) පීඨ ශිෂ්‍ය සමිති සියල්ලකම මූලසුන දැරීම

(ආ) පීඨ ශිෂ්‍ය සමිතියෙ 'තීරණ ක්‍රියාත්මක කිරීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියෙ 'රැස්වීම් කැඳවීම විය යුතුය

(ii) පීඨ ශිෂ්‍ය සමිතියෙ 'උප සභාපතිගේ කාර්ය සහ කර්තව්‍ය.

(අ) සභාපති නොපැමිණි අවස්ථාවලදී පීඨ ශිෂ්‍ය සමිතියේ කිසියම් රැස්වීමක මූලසුන දැරීම

(ආ) සභාපතිගේ රාජකාරි ඉටු කිරීමෙහිලා ඔහුට සහයවීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතිය විසින් ඔහුට පවරනු ලැබ ඇති වෙනත් කිසියම් රාජකාරි හෝ කාර්යය ඉටු කිරීම විය යුතුය

(iii) පීඨ ශිෂ්‍ය සමිතියේ ලේකම් හෝ කාර්ය සහ කර්තව්‍ය

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ සහ කෘතිවල ලේඛණ පවත්වා ගැනීම

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ පීඨ ශිෂ්‍ය සමිතියේ මුළු සාමාජිකත්වයෙන් 1/3 කට අඩු නොවන සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට හෝ පීඨ ශිෂ්‍ය සමිති රැස්වීම් කැඳවීම සහ

(ඇ) විශ්වවිද්‍යාලයේ කිසියම් සිසුවෙකුට පරීක්ෂා කිරීම සඳහා සහ කෘතිවල වාර්තා ලබාදෙන බව සහතික කිරීමද විය යුතුය.

(iv) පීඨ ශිෂ්‍ය සමිතියෙ 'කණිෂ්ඨ භාණ්ඩගාරිකගේ කාර්ය හා කර්තව්‍යය

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ අරමුදල් භාරයේ තබාගැනිම.

(ආ) සියලුම ආදායම් හා වියදම්, එම ගිණුම් පවත්වා ගැනිමට අදාල යම් නීතියකට යටත්ව, එම කාර්යය සඳහා පවත්වාගනු ලබන පොත්වල නියමාකාරයෙන් වාර්තා කර ඇති බවට වගබලා ගැනිම.

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියට යම්කිසි ගෙවීමක් කළ විට එම ගෙවීම පිළිබඳ සතියක් ඇතුලත දී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දිම

(ඈ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ගේ අනුමැතිය ඇතිව පීඨ ශිෂ්‍ය සමිතියෙ 'අරමුදල් වලින් ගෙවීම් කිරිම

(ඉ) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් තේරීම් දින සිට මසක කාලයක් තුලදි, එම ලනිලධාරින් සමග සාකච්ජා පැවැත්වීමෙන් පසුව අධ්‍යයන වර්ෂය සඳහා අයවැය වාර්තාවක් පිළියෙල කිරිම.

(ඊ) අවශ්‍ය විටදි පරිපූරක ඇස්තමේන්තුව පිළියෙල කිරිම

(උ) එක් එක් අධ්‍යයන වාරයේ අවසාන දින වනවිට පීඨ ශිෂ්‍ය සමිතියෙ 'ජංගම සහ පූර්වානුමනය කළ මුදල් තත්වය පිළිබඳව වාර්තාවක්, අදාල සෑම වාරයක්ම අවසාන අන්තිම මාසය තුලදි පීඨ ශිෂ්‍ය සමිතියට ඉදිරිපත්කිරිම සහ

(ඌ) පීඨ ශිෂ්‍ය සමිතිය තෝරාගනු ලැබූ අධ්‍යයන වර්ෂය සඳහා එම ශිෂ්‍ය සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශකයක් සහ එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද, එහි වර්ෂය අවසානයේ සති 2 ක් ඇතුලත දි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරිම.

## 111 කොටස

16. (i) ප්‍රධාන විධායක නිලධාරියා විසින්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ප්‍රධාන රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් යෙදිය යුතු අතර, එම රැස්වීමේදි පීඨ ශිෂ්‍ය සමිතිවල සියලුම සාමාජිකයින් විසින්, විශ්වවිදයාල ශිෂ්‍ය සමිතියෙ 'නලධරයන් (තමන් අතුරෙන්ම) තෝරා ගතයුතු වේ. එම දිනය, මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 කොටසේ අදාල වගන්ති වලට අනුව පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් හා වෙනත් සාමාජිකයින් තෝරාගනු ලැබීමෙන් සති 2 ක කාලයක් ඇතුලත එළඹෙන දිනයක් විය යුතුය.

(ii) මෙම රැස්වීමේ කාර්යාර්ථයන් සඳහා රහස් ජන්දයක් මගින් නලධරයන් තේරීමේ නිලවරණය පැවැත්වීම පිණිස තේරීම් භාර නිලධාරි වශයෙන් විශ්වවිද්‍යාලයේ

ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ප්‍රධාන විධායක නිලධාරියා විසින් නම් කරනු ලැබිය යුතුය. හෙතෙම එම රැස්වීමේ මූලසුන දැරිය යුතු අතර, නිර්බාධිතව නිලවරණය පැවැත්වීම සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම පියවර ගත යුතුය.

(iii) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියෙ 'ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන විධායක නිලධාරි විසින් පත් කරගනු ලැබීම සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු නිලධරයන් තේරීම අවසානයේදී විශ්වවිදයාල සමිතිය විසින් නම් කරනු ලැබිය යුතුය.

(iv) තේරීම් භාර නිලධාරි විසින් ප්‍රධාන විධායක නිලධාරි වෙත යථෝක්ත නිලවරණය සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ.

17\. (i) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ එක් එක් නිලධරයා ඔහුව තෝරාගනු ලබන දින සිට අදාල අධ්‍යයන වර්ෂයේ අවසානය දක්වා තම නිලය දැරිය යුතුවේ.

(ii) කිසිදු සාමාජිකයෙකු එක් අධ්‍යයන වර්ෂයකට වඩා එම නිලයම දැරීමට හෝ එම නිලයටම නැවත වරක් තේරී පත්වීමට හෝ සුදුසුකම් නොලැබේ.

(iii) යම් නිලධරයෙකු,

(අ) ඉදිරියටත් ශිෂ්‍යභාවයේ රැදී සිටින්නේ නම් හෝ

(ආ) සිය අත්සනින් යුතුව ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත, නිලයෙන් ඉල්ලා අස්වීමේ ලියවිල්ලක් භාරදෙන්නේ නම් හෝ

(ඇ) විශ්වවිද්‍යාලයෙන් අත්හිටුවා හෝ නෙරපනු ලබන්නේ නම් හෝ ඔහුගේ නිලය පුරප්පාඩු වී ඇති බවට සලකනු ලැබේ.

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියක නිලයක් පුරප්පාඩුවක් ඇති විටකදී විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා තීරණය කර ඇති පරිදි විශ්වවිධයාල ශිෂ්‍ය සමිතිය විසින්, නිලධරයෙකු / සාමාජිකයෙකු තේරීම සඳහා නිලවරණයක් පැවැත්වීම පිණිස කටයුතු ආරම්භ කළ යුතුය.

18\. (i) මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමිත 15 (I) වගන්තියට අනුකූලව විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය සහ කර්තව්‍ය පීඨ ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය වලට සමාන වන්නේය.

(ii) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ උප සභාපතිගේ කාර්ය සහ කර්තව්‍ය, මෙම අතුරු ව්‍යවස්ථාවල 15 (II) වගන්තියෙහි පරිදි පීඨ ශිෂ්‍ය සමිතියෙ 'උප සභාපති තනතුරෙහි නියමිත කාර්ය හා කර්තව්‍ය වලට සමාන වේ.

(iii) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියෙ 'ලේකම් හෝ කාර්ය සහ කර්තව්‍ය මෙම ව්‍යවස්ථාවේ 15 (111) වගන්තියෙහි නිශ්චිත පරිදි පීඨ ශිෂ්‍ය සමිතියෙ 'ලේකම්ගේ කාර්ය හා කර්තව්‍ය වලට සමාන වේ.

(iv) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියෙ 'ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික සතු කාර්ය හා කර්තව්‍ය

(අ) සියලුම ආදායම් හා වියදම් එම ගිණුම් පවත්වා ගැනිමෙහිලා අදාල නීති රෙගුලාසි වලට යටත්ව, ඒ සඳහා නියමිත පොත් වල නියමාකාරයෙන් වාර්තාගත කර ගිනුම් නොකර ඇති බවට වගබලා ගැනිම.

(ආ) සංගමයට ගෙවනු ලබන යම් මුදලක් වෙනොත් එබදු මුදල් ගෙවීම් සම්බන්ධයෙන් සතියක කාලයක් තුලදි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දිම.

(ඇ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව සමිතියේ අරමුදල් වලින් මුදල් ගෙවීම් කිරිම

(ඈ) සමිතියේ නිලධාරින් තෝරාගනු ලබන දින සිට මාසයක කාලයක් තුලදි අදාල අධ්‍යයන වර්ෂය සඳහා අයවැය පිලියෙල කොට එය සමිතිය වෙත ඉදිරිපත් කිරිම. මෙම කාර්ය සඳහා නිලධාරින් සමග හෝ සමිතියෙ 'ස්ථාවර කමිටුවක් ඇත්නම් ඒඅ ය සමග හෝ සාකච්ජා කිරිමට ඔහුට පුලුවන.

(ඉ) අවශ්‍ය විටදි පරිපූරක ඇස්තමේන්තු පිලියෙල කිරිම

(ඊ) සමිතිය තෝරාගනු ලැබු අධ්‍යයන වාර්ෂය අවසානයේ සති දෙකක කාලයක් ඇතුලත දි අධ්‍යයන වර්ෂයක් සඳහා සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශනය ද එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද එහි වර්ෂය අවසානයේ සති 2 ක් ඇතුලත දි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් විගණක වරයා වෙත ඉදිරිපත් කිරිම.

19 මෙම අතුරු ව්‍යවස්ථාවේ අර්ථනිරූපන සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙනෙත් පාලක සභාව වෙත යොමු කලයුතු වන අතර, පාලක සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

20 මෙම අතුරු ව්‍යවස්ථාවේ සනාතන සභාව විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, අධ්‍යයන වර්ෂය යනුවෙන් අදහස් වන්නේ, යම් වර්ෂයක ඔක්තෝම්බර් මස පලමුවන දිනෙන් ඇරඹි ඊට පසු වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන්නාවූ කාල පරිච්ජේදය වේ.

පනත යනු 1978 අංක 16 දරණ සංශෝධිත පනත වේ.

විගණක යන්නෙන්, විශ්වවිදයාල ශිෂ්‍ය සමිතියෙ 'හෝ යම් පීඨ ශිෂ්‍ය සමිතියක ගිණුම්

විගණනය සඳහා ප්‍රධාන විධායක නිලධාරි විසින් පත්කරනු ලබන කිසියම් විගණකවරයෙකු අදහස් වේ.

පාලක සභාව යනු රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව වේ.

පීඨාධිපති යන්නෙන් එක් එක් පීඨයෙහි පීඨාධිපති වරයා හෝ අවස්ථානුකූලව පීඨාධිපති සඳහා වැඩබලන වෙනත් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

පීඨය යනු පනත යටතේ රජරට විශ්වවිද්‍යාලය මගින් සංස්ථාපිත කිසියම් පීඨයක් වේ.

ප්‍රධාන විධායක නිලධාරි යන්නෙන් උපකුලපති හෝ අවස්ථානුකූලව උපකුලපතිධූරයෙහි රාජකාරි ඉටුකරන්නා වූ වෙනත් කිසියම් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

ලේඛකාධිකාරි යන්නෙන් රජරට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි හෝ අවස්ථානුකූලව ලේඛකාධිකාරි වෙනුවට වැඩබලන වෙනත් කිසියම් පුද්ගලයෙකු අදහස් වේ.

සනාථන සභාව යන්නෙන් රජරට විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ.

අධ්‍යයන පාඨමාලාවක් හදාරන යන්නෙන් කිසියම් අධ්‍යයන පාඨමාලාවක් අරඹන ලදුව එම පාඨමාලාව හැදෑරීමෙහි නියුතු ලියාපදිංචි සිසුන් අදහස් කෙරේ.

නිලවරණ නිලධාරි යන්නෙන් ඡන්දය පැවැත්වීමේ කාර්යය මෙහෙයවීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි විසින් නම් කරනු ලබන තැනැත්තා අදහස් කෙරේ.